දුරකථන/தொலைபேசி இல./ Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊ-මේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்விஅமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල .
'இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.


ඔබේ අංකය / உமது இல. / Your No. } ..................

මගේ අංකය / எமது இல. / My No. } ED/01/21/04/04

දිනය / திகதி / Date } 2015.12. 31

**චක්‍රලේඛ අංක 35/ 2015**

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
සියලු ම විදුහල්පතිවරුන් වෙත

**<u>පාසල් තුළ සෞඛ්‍යාරක්ෂිත ආපන ශාලා පවත්වාගෙන යාම</u>**

මේ සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති 2007/02 අංක දරණ 2007.01.10 දිනැති චක්‍රලේඛය හා 2011/03 අංක දරණ 2011.01.18 දිනැති චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛය මින් ඉදිරියට වලංගු වේ.

පාසල් දරුවන්ගේ කායික මානසික වර්ධනය සහ සංවර්ධනය සඳහා සෞඛ්‍යය හා පෝෂණය ඉතා වැදගත් වේ. එසේ වුවද පසුගිය කාලය තුළ කරන ලද අධ්‍යයන තුළින් අනාවරණය වී ඇත්තේ දරුවන් විවිධ වූ පෝෂණ ගැටලුවලට ගොදුරු වී ඇති බවයි. මේ සඳහා ප්‍රධාන හේතු ලෙස වැරදි ආහාර පුරුදු දැක්විය හැකි ය.

සෞඛ්‍යාරක්ෂිත ආහාර දරුවාගේ ඉගෙනීම කෙරෙහි සංවර්ධනාත්මක බලපෑමක් ඇති කරයි. සෞඛ්‍යාරක්ෂිත හා පෝෂ්‍යදායී ආහාර ලබා නොගැනීම නිසා අධ්‍යාපන කටයුතු අඩාලවනවා සේම කෘෂබව, මිටි බව, අධිබර, ස්ථුලතාව වැනි පෝෂණ ගැටලුවලට ගොදුරු වීම ද ඒ නිසාම හෘද රෝග, දියවැඩියාව, පිළිකා වැනි බෝ නොවන රෝග සහ දන්ත ආබාධ වැනි වෙනත් ආබාධ වැළඳීමේ අවදානම ද වැඩි වී ඇත.

නිවැරදි ආහාර පුරුදු ගොඩනැගීම සඳහා අත්දැකීම් පාසල් පරිසරය තුළදී ම ලබා දීම ඉතා වැදගත් වේ. ඒ අනුව වර්තමානයේ ආපන ශාලා තුළ බහුල ව ඇති ක්ෂණික ආහාර හා කාබනීකෘත බීම වෙනුවට ශ්‍රී ලංකා ජාතික පෝෂණ ප්‍රතිපත්තියට අනුව සෑම පුද්ගලයෙකුට ම නිසි පෝෂණ අවශ්‍යතා ආවරණය වන පරිදි ප්‍රමාණාත්මක හා ගුණාත්මක බවින් යුක්තව ආහාර ලැබෙන බවට සහතික විය යුතු ය.

නිවැරදි පෝෂණ පුරුදු ඇති කිරීම සහ දැනුම ලබා දීම මෙන්ම ආහාර සුලබතාව, සුරක්ෂිත බව ඇති කිරීම සහ සාධාරණ මිල ගණන් යටතේ මිල දී ගැනීමේ හැකියාව ආපන ශාලා තුළින් අපේක්ෂා කෙරේ.

ඒ තුළින් පෝෂණ ගැටලුවලින් තොර නිරෝගී දරු පරපුරක් බිහි කිරීමට හැකිවනු ඇත.

මේ අනුව 2016 ජනවාරි මස ඇරඹෙන නව පාසල් වාරයත් සමග පාසල්වල ආපන ශාලා තුළ හා පාසල් පරිසරය තුළ ආහාර සැපයීමේ දී පහත නිර්ණායක අනුව ක්‍රියා කිරීම අනිවාර්යය වේ.

1. පාසල් ආපන ශාලාව පාසල් සංවර්ධන සමිතිය විසින් පවත්වා ගෙන යාම සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් කොන්ත්‍රාත්කරුවකු වෙත පැවරීම පාසල් සංවර්ධන සමිතිය මගින් තීරණය කළ යුතු ය. කෙසේ වුවද පාසල් ආපන ශාලාව පවත්වා ගෙන යාම පිළිබඳ වගකීම පාසල් සංවර්ධන සමිතිය සතු වේ.

   a. 1980 අංක 26 දරණ ආහාර පනතේ විධි විධාන අනුව ද, 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ පනත සහ එහි විධි විධාන අනුව ද, සෑම පාසලක ම සිසුන්ට සෞඛ්‍යාරක්ෂිත ආහාර ලබා ගැනීමේ පහසුකම් හා පෝෂ්‍යදායී ආහාර ලබා ගැනීමේ පහසුකම් ඇති කිරීම හා ඒ පිළිබඳ සහතික වීම.
   b. ආහාර සකස් කරන්නන්, ආහාර සපයන ස්ථාන හා භාවිත කරන උපකරණවල පවිත්‍රතාව පිළිබඳ සහතික වීම.
   c. පාසල් ආපන ශාලා තුළ ප්‍රවර්ධනය කළ යුතු සෞඛ්‍යයට හිතකර ආහාර අලෙවිය දිරිමත් කිරීම.
   d. පාසල් ආපන ශාලා තුළ තහනම් කරන ලද අධික තෙල්, අධික සීනි, අධික ලුණු සහිත ආහාර අලෙවි නොකිරීම.

2. පාසල් ආපන ශාලාව පවත්වා ගෙනයාම පාසල් සංවර්ධන සමිතියේ පූර්ණ වගකීම හා අධීක්ෂණය යටතේ සුභසාධන කටයුත්තක් සේ සලකා ක්‍රියාත්මක විය යුතු ය.

3. පාසල් ආපන ශාලා පවත්වා ගෙන යාම පිළිබඳ ඇගයීම හා නියාමනය සඳහා පාසල් සංවර්ධන සමිතිය විසින් අනු කමිටුවක් පත් කර වගකීම පැවරිය යුතු වේ. එය පාසල් "ආහාර කමිටුව" ලෙස නම් කෙරේ.

ආහාර කමිටුව විදුහල්පති හෝ විදුහල්පති විසින් නම් කරනු ලබන නියෝජ්‍ය විදුහල්පතිවරයකුගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය යුතු අතර, එහි සාමාජික සංඛ්‍යාව සාමාජිකයන් 06 ත් 12 ත් අතර සංඛ්‍යාවක් විය යුතු ය. එහි සංයුතිය පහත පරිදි විය යුතු ය.

- විදුහල්පති / නියෝජ්‍ය විදුහල්පති (කමිටු ප්‍රධානී)
- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු භාර ගුරු මහතා හෝ මහත්මිය
- වෙනත් ගුරුභවතෙකු
- පාසල අයත් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක
- පාසල් සෞඛ්‍ය ශිෂ්‍ය සමාජයේ සාමාජිකයකු
- පරිසර භට කණ්ඩායමේ සාමාජිකයකු
- ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයකු
- පාසල් සංවර්ධන සමිතියේ සාමාජිකයකු
- ප්‍රධාන ශිෂ්‍ය නායක /නායිකාව හෝ වෙනත් ශිෂ්‍ය නායකයකු/ නායිකාවක්
- පාසල් පාරිභෝගික කවයක සාමාජිකයකු

4. පාසල තුළ පාසල් සංවර්ධන සමිතිය විසින් ආපන ශාලාවක් පවත්වා ගෙන යන්නේ නම් පාසල් සංවර්ධන සමිතිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සමග ඒ පිළිබඳ ගිවිසුමකට එළඹිය යුතු අතර එහි පිටපතක් ආපන ශාලාව තුළ ප්‍රදර්ශනය කළ යුතු ය.

5. ආහාරවල මිල ගණන් තීරණය කිරීම ආහාර කමිටුවේ අනුමැතිය මත විය යුතු අතර සහනදායී මිල ගණන් යටතේ ආහාර ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කිරීම අනිවාර්යය වේ. මිල ගණන් වෙනස් කළ හැක්කේ ද ආහාර කමිටුවේ අනුමැතියකින් පමණක් වන අතර මිල දර්ශනය ආපන ශාලාව තුළ ප්‍රදර්ශනය විය යුතු ය.

6. පාසලේ ආහාර කමිටුව මාසිකව රැස්විය යුතු අතර පාසල් වාරයකට වරක් පාසල් ආපන ශාලාව පිළිබඳ ඇගයීම් වාර්තාවක් පිළියෙල කර කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ වෙත හා කලාප අධ්‍යාපන කාර්යාලයේ සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුවට ඉදිරිපත් කළ යුතු ය.

7. පාසල් ආපන ශාලා පිළිබඳ සොයා බැලීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වන අතර ඒ පිළිබඳ පසු විපරම් වාර්තාව පාසල් ආහාර කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.ඒ අනුව පාසල් ආහාර කමිටුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ තහවුරුවක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ලබා ගත යුතුවේ.

8. පාසල් ආපන ශාලාව හුදෙක් පාසලට ආදායම් ලැබෙන ස්ථානයක් පමණක් නොවිය යුතු අතර සිසුන්ගේ සෞඛ්‍යය හා පෝෂණය නගා සිටුවීමට දායක වන පරිදි සැලසුම් කළ යුතු ය. ආපන ශාලාවෙන් ලැබෙන ආදායම් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැර කළ යුතු ය.

පාසල් පරිසරය තුළ සෞඛ්‍යයට හා පෝෂණයට හිතකර ආහාර සැපයීම සිදුවන බවට මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ වාර්තාවක් පාසල් වාරයකට වරක් ලබා ගැනීම සුදුසු වේ.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය මඟපෙන්වීම "පාසල් තුළ සෞඛ්‍යාරක්ෂිත ආපනශාලා පවත්වාගෙන යාම පිළිබඳ උපදෙස් සංග්‍රහය" තුළ ඇතුළත් වන අතර එයට අනුකූල ව ක්‍රියා කිරීමට කටයුතු කළ යුතු ය.

ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මගින් පාසල් සිසුන්ගේ සෞඛ්‍යය හා පෝෂණ මට්ටම ප්‍රවර්ධනය වන ආකාරයට පාසල්වල ආපන ශාලා පවත්වා ගෙන යාම අපේක්ෂා කෙරේ.

ඩබ්ලිව්.එම්.බන්දුසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත-
01. ජනාධිපති ලේකම් ,ජනාධිපති කාර්යාලය
02. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
03. විගණකාධිපති
04. සභාපති, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
05. සියලු ම දිස්ත්‍රික් ලේකම් වරුන්
06. විභාග කොමසාරිස් , විභාග දෙපාර්තමේන්තුව
07. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
08. ප්‍රධාන කොමසාරිස්, අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාව
09. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්

**........................ වර්ෂය සඳහා විද්‍යාලයීය ආපන ශාලාව පවත්වාගෙන යාම සඳහා වූ ගිවිසුම්පත**

**කොන්ත්‍රාත්කරුවකු මගින් පවත්වාගෙන යන්නේ නම් :**

................................................... විද්‍යාලයීය ආපන ශාලාව බදු දීම සම්බන්ධව පිළිගත් ටෙන්ඩර් මණ්ඩලයක් මගින් ..................................... දින කරන ලද තෝරා ගැනීමට අනුව පාසල් සංවර්ධන සමිතිය විසින් ගන්නා ලද තීරණය පරිදි ..................................................... විද්‍යාලයේ විදුහල්පති බදු දීමනාකරු ලෙස පළමුවෙනි පාර්ශවය වෙනුවෙන් ද .............................................................................................................. හි පදිංචි....................................................ජාතික හැඳුනුම්පත් අංක දරණ ..................................................... මහතා බදු ගැණුම්කරු ලෙස දෙවන පාර්ශවය වෙනුවෙන් ද පහත සඳහන් කොන්දේසි හා වගන්ති වලට යටත්ව මෙම ගිවිසුම ඇතිකර ගන්නා ලදී.

**පාසල් සංවර්ධන සමිතිය මගින් පවත්වාගෙන යන්නේ නම් :**

..........................................දින පාසල් සංවර්ධන සමිතිය විසින් තීරණය කළ පරිදි .............................................. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ බදු දීමනාකරු ලෙස පළමුවෙනි පාර්ශවය වෙනුවෙන් ද ......................................................පාසල් සංවර්ධන සමිතියේ සභාපති බදු ගැණුම්කරු ලෙස දෙවන පාර්ශවය වෙනුවෙන් ද පහත සඳහන් කොන්දේසි හා වගන්ති වලට යටත්ව මෙම ගිවිසුම ඇතිකර ගන්නා ලදී.

1. ............................ චක්‍රලේඛයට හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර පනතට අනුකූලව පාසල් ආපන ශාලාව පවත්වා ගෙන යා යුතු ය.
2. මෙම ගිවිසුම වලංගු වන්නේ පවත්නා වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පමණි.
3. පාසල් ආහාර කමිටුවේ නියාමනය හා මඟ පෙන්වීම යටතේ පවත්වා ගෙන යා යුතු ය.
4. ආහාරපානවල මිළ ගණන් සඳහා පාසල් ආහාර කමිටුවේ අනුමැතිය ලබාගත යුතු අතර ආපන ශාලාවේ මිළ දර්ශකය පහත ආකෘතියට අනුව ප්‍රදර්ශනය කළ යුතු ය.

| ආහාර වර්ගය | ප්‍රමාණය | මිල රු. |
|---|---|---|
| | | |

5. ආපන ශාලාව පවත්වා ගෙන යාම සඳහා සේවකයන් බඳවා ගැනීම, ඔවුන්ගේ වේතන ගෙවීම හා විදුලිය සඳහා වියදම ආපන ශාලාවේ ආදායමෙන් ම ආවරණය කරගත යුතු ය.
6. ආපන ශාලාව සෞඛ්‍යවත්ව පවත්වාගෙන යාමට භාවිත කරන සියලු ම භාණ්ඩ හා පරිසරය නිරන්තරව පිරිසිදුව හා ආරක්ෂාකාරීව පවත්වාගෙන යා යුතු ය.
7. ආපන ශාලාවේ සේවකයන් සඳහා හැඳුනුම්පතක් ලබාදිය යුතු අතර සැම අවස්ථාවකදී ම එය පැළඳ සිටිය යුතු ය.
8. ආපන ශාලාවේ සේවකයන් පාසල් භූමිය තුළ නිකරුනේ ගැවසීම වළක්වා ගත යුතු වේ.
9. ආපන ශාලාවේ සේවකයන් සැම විටම පිරිසිදු හා පූර්ණ ඇඳුමකින් සැරසී සිටිය යුතු අතර පාසලේ නීති රීති වලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.
10. බාලිකාවන් ඉගෙනුම ලබන පාසලක් නම් අවම වශයෙන් එක් කාන්තා සේවිකාවක්වත් සේවක මණ්ඩලයට අයත් විය යුතු ය.
11. පාසලේ විදුහල්පතිගේ අවසරයකින් තොරව පාසල් වේලාවෙන් පසුව ආපන ශාලාවේ රැඳී නොසිටිය යුතු ය.

12. රජයේ අනුමත පාසල් දිනවල දී ආපන ශාලාව විවෘතව තිබිය යුතු කාලය පෙ.ව.7.00 සිට ප.ව.2.30 දක්වා වන අතර, පාසලේ අවශ්‍යතාවය මත අමතර කාලයක් විවෘත කොට තබා ගන්නේ නම් විදුහල්පති/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය මත තීරණය කර ගත හැකි ය.

13. විශේෂ අවස්ථාවල දී, නිවාඩු දිනවල දී වුව ද ආපන ශාලාව විවෘත කළ යුතු අතර, පාසලේ අවශ්‍යතාවය මත අමතර කාලයක් විවෘත කොට තබා ගන්නේ නම් විදුහල්පති/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය මත තීරණය කර ගත හැකි ය.

14. ආහාර ද්‍රව්‍ය වලට අමතර වෙනත් ඕනෑම ද්‍රව්‍යයක් ආපන ශාලාව තුළ අලෙවි කළ හැක්කේ ආහාර කමිටුවේ අනුමැතිය මත පමණි.

15. චක්‍රලේඛ අංක 35/2015 අනුව ගුණාත්මක හා ප්‍රමාණාත්මක ලෙස ආහාර සැපයිය යුතු ය.

16. පාසල සතු කිසිදු භාණ්ඩයක් විදුහල්පතිගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම විටක බැහැරට ගෙන යාම නොකළ යුතු ය.

17. ආපන ශාලාව පවත්වාගෙන යාම පාසල් සංවර්ධන සමිතියේ පූර්ණ වගකීම හා අධීක්ෂණය යටතේ සිදුවිය යුතු ය.

තවද ඉහත සඳහන් ප්‍රධාන කොන්දේසි වලට අමතරව යථෝක්ත ආපන ශාලා ගිවිසුම් පත්‍රය ඉදිරිපත් කිරීමේ දී එම ඇමුණුමෙහි සඳහන් සියලු ම කොන්දේසි හා නියමයන් කඩ නොකරන බවට දෙවැනි පාර්ශවය එකඟ වේ.

**පළමුවෙනි පාර්ශවය**

බදු දීමනාකරු

..................................

ජා.හැ. අංකය

(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/විදුහල්පති )

**දෙවැනි පාර්ශවය**

බදු ගැණුම්කරු

....................................

ජා.හැ. අංකය

සාක්ෂි 1. නම - .....................................

අත්සන - .................................

ජා.හැ. අංකය - ..........................

2. නම - ...................................

අත්සන - ...............................

ජා.හැ. අංකය - .......................